දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) FHB/SHU/ /Let/ 2020
My No. )

ඔබේ අංකය )
உமது இல
Your No. : )

දිනය )
திகதி ) 29 /04/ 2020
Date )

# සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
# சுகாதார மற்றும் சுதேசவைத்தியச் சேவைகள் அமைச்சு
# Ministry of Health and Indigenous Medical Services

එන් . එච්. එම්. චිත්‍රානන්ද,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

**පාසල් පරිශ්‍ර තුල කොවිඩ් 19 වසංගත රෝග ව්‍යාප්තිය වැළැක්වීම පිළිබඳ සූදානම සඳහා වූ අතුරු මාර්ගෝපදේශය - 2020 අප්‍රේල් 27**

කොරෝනා වෛරස රෝගය (කෝවිඩ් 19 ) පිලිබඳව දැනට හඳුනාගෙන ඇති දත්ත විශලේෂණයන්ට අනුව මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත.

කෝවිඩ් 19 වෛරස ආසාධනය ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වීම ආරම්භ වූ සැනින් එනම් 2020 මාර්තු 12 දින සිට සියළුම පාසල් වසා දැමීමට තීරණය විය. එය ඉතා කාලෝචිත ක්‍රියාවක් ලෙස හඳුනාගත හැකි අතර මේ සමගම සමස්ථ ශ්‍රී ලංකාවටම බලපවත්වන පරිදි ඇඳිරි නීතිය ක්‍රියාත්මක විය.

ඒ අනුව නැවත රට තුළ සාමාන්‍ය ජන ජීවිතය ක්‍රියාත්මක කළ හැකි පරිදි පනවා ඇති ඇඳිරිනීතිය ලිහිල් කරන අවස්ථාවකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ මෙම මාර්ගෝපදේශයෙන් විස්තර කෙරේ.

වෛරස ව්‍යාප්තිය පාලනයට අදාළව ශාරීරික දුරස්ථභාවය සහ දෙඅත් සේදීම, විෂබීජ හරණය, ශ්වසන පද්ධතිය ආශ්‍රිත සනීපාරක්ෂක පිළිවෙත් පුහුණු කිරීම ඇතුළු අනෙකුත් ආරක්ෂණ පිළිවෙත් සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මහජනතාව වෙත තරයේ අවවාද කර ඇත. ඊට අමතරව වැළැක්විය හැකි සියළුම පුද්ගල සංචරණ සහ අවදානම් අඩු සහ වැඩි කලාප අතර පුද්ගල හුවමාරු වීම් අවම වන පරිදි සමාජ ආරක්ෂණ ක්‍රමෝපායන් සකස් කර ඇත.

එසේම ඉහත රෝග අවධානම පාලන පටිපාටි වලට අනුගතව ජනතාව වෙත අත්‍යවශ්‍ය සේවා සැපයීම් සිදු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත.